හද රිදවන මතක සුවඳ

8

රෝහිත මුණසිංහ

ප්‍රංශයේ සිට

(පසුගිය කලාපයෙන්)

"අනේ රත්තරං මල්ලියේ, ඒක නම් කරන්න බෑ. නංගිලයි ගෙදරින් එයැයි මොහට එවන්නේ මම ගැන විශ්වාස කරලනේ. ඒ විශ්වාසය කඩන්න බෑ."

ලතා අක්කා පැවසුවේ මගේ හිත නොරිදෙන අයුරිනි. මට ඇය ගැන තරහක් ඇති නොවී ය. ලතා අක්කාගේ අවංක බව එබඳු විය.

2004 වර්ෂයේ ජූලි මස ප්‍රංශයේ සිට ලංකාවට ගිය වාරයේ අගෝසතු මාසයේ දිනක මමත් බිරිඳත් ලතා අක්කාගේ නිවසට ගොඩවූයේ අවුරුදු පහළොවකට වැඩි කාලයකින් නොදුටු මේ සහෝදරිය දැක ගැනීමටය. අප එහි ගිය විට නිවසේ හිටියේ ලයියාගේ අම්මා පමණ ය. ඇය සතුටු කඳුළු හෙළුවේ අප දෙදෙනා වැලඳ ගනිමිනි.

"දූලා දෙන්නා ඉස්කෝලෙ යවන්න ඕනෙ නිසා ලොකු දූ දැන් පදිංචි වෙලා ඉන්නේ ගාල්ලේ"

අප එහි සිටම දුරකථනය මගින් ලතා අක්කා ඇමතුවෙමු.

"අනේ මල්ලියේ, මේ රෑ නෙවෙයි නම් අපි දැන්මම මල්ලිලා බලන්න එනවා. ඉතින් හෙට කොළඹ යනවා නම් වරදිදැන්නෙම නැතුව අපේ ගෙදරට ගොඩ වෙලා යන්නම ඕන. මල්ලියි නංගියි දකින්න ආසාවේ බෑ. ඔන්න මල්ලිලා ඒ කාලේ කට ගෙවෙනෙකම් කථා කරලා, කකුල් ගෙවෙනතුරු කැන්වසින් ගිහිල්ලා හිරගෙ වල්වල වැටිලා දුක් විඳපුවයි ප්‍රතිඵල තමයි දැන් මේ ලැබිලා තියෙන්නේ"

ඇය අතීතය සමරමින් මහත් සතුටකින් පැවසුවේ ජ.වි. පෙරමුණට මන්ත්‍රීධුර 39 ක් ලැබී තිබීම ගැනය.

ඉන් මාස හතරකට පසුව මගේ අසරණ මව්බිමට සුනාමි ජල රකුසා කඩා පනින විට අප උන්නේ සුව නින්දක ගැලිය. ලංකාවේ උදෑසන 9.00 වන විට ප්‍රංශයේ වෙලාව පාන්දර 4.00ය. දුරකථන හැඩවුණේ පාන්දර පහටය.

"අයියේ මහ මුහුද ගොඩ ගලලා මහා විනාශයක් ? ගමට මොනවා වෙලාද කියලා තවම දැන ගන්න විදියක් නෑ."

මල්ලි මා අමතන ලද්දේ කොළඹ සිටය. එදින අප්‍රේල් පළවෙනිදාවක් නොවූයෙන් මේ සීත ඍතුවේ පාන්දර පහට නින්ද කඩා විහිළු කිරීම ගැන ඇති වූ නොරිස්සුමෙන් මම මල්ලිට බැණ වැදුනෙමි. එය සත්‍යයක් බව මල්ලි දිවිරමින් පැවසී ය. ලංකාවට දුරකථන ඇමතුමක් ගත හැකි වූ මොහොතේ සිට මා දිගින් දිගටම උත්සහ කරන ලද්දේ මගේ ඥාති හිත මිතුරන්ගෙන් විපතට පත් වී ඇත්තේ කවුරුන්ද කියා දැන ගැනීමට ය.

"ලතා අක්කා සුනාමියට අනුවෙලා" යන දුක්බර ආරංචිය ලැබුණේ සතියකට පසුවය.

ගාල්ල නගරයත්, ගාලු කොටුවත් මට ආගන්තුක තැනක් නොවූයේ ගාලු කොටුව ඇතුළේ වූ 'වෝක්ර්ස් පුත්‍ර සමාගමේ' මා වසර ගණනාවක් රාජකාරි කර ඇති බැවිනි. ලතා අක්කලා මිය ගියේ මේ අයුරින් විය හැකියැයි මම චින්ත රූප මවමි.

ලතා අක්කාත්, ඇගේ සැමියාත්, දියණියන් දෙදෙනාත් එම ඉරිදා උදෑසන නවය වෙද්දී නගරයට එන්නට ඇත්තේ කුමක් සඳහා ද? දියණියන් ටියුෂන් පංතියකට අරලවීම සඳහා ද ? වෙළඳ පොළට යාමට ? වැලිගම මහගෙ දරට ගොස් අම්මා බැලීමට ?

සුනාමි ජල රකුසා අනුකම්පා විරහිතව ඔවුන් කරා කඩා පනින ඇසිල්ලේ ඇය උන්නේ එක් දියණියකගේ අතකින් අල්ලාගෙන විය හැකි ය. ඇය මරහඬ දෙමින් දරුවා වැළඳ ගනියි. රුදුරු සැඩ පහරට ගසාගෙන යමින්ම වතුරේ ගිලි ගිලි දැලෙන ඇය එක් අතකින් දියණිය තරයේ අල්ලා ගෙනම අනිත් අතින් කුමක හෝ එල්ලෙන්නට උත්සහ කරයි. එහෙත් වතුර පෙවී සිහිවිකල වන ඇයගේ ගත අප්‍රාණික වෙයි. හුස්ම හිරවී දෑස් විසල්වන අවසාන මොහොතේත් ඇය තම සැමියා හා අනෙක් දියණිය දැක ගන්නට උත්සහ දරන්නට ඇත. අවසානයේ ඇයගේත් දියණියගේත් අප්‍රාණික සිරුරු වතුර යටට කිඳා බසී. වියරු ජලකඳ නගරය ද, මිනිසුන් ද බිලිගෙන ආ වේගයටත් වඩා වැඩි වේගයෙන් මුහුදට ඇදී යද්දී අන් සිය දහස් දෙනෙකු මෙන්ම ඔවුන් දෙදෙනාද රැගෙන ගොස් සාගර පතලේ සඟවා ගන්නට ඇත. ලතා අක්කාගේ සැමියාගේත් අනෙක් දියණියගේත් මළ සිරුරු ලැබී ඇතත් ලතා අක්කාගේත් දියණියගේත් හෝඩුවාවක් වත් ලැබී නැත්තේ එම නිසා නොවේද ?

මගේ රටේ 40,000කට අධික ජනතාවක් මිනිත්තු දහයක් ඇතුළතදී මියගියේ කුමන ධර්මතාවකට අනුවදැයි මම කල්පනා කරමි. ලතා අක්කාත්, දරු දෙදෙනාත්, සැමියාත් එකටම මියගියේ ඔවුන් එසේ වන්නට පතාගෙන ආ නිසාද ? යම් හෙයකින් ලතා අක්කාගෙ ජීවිතය පමණක් ගැලවුණි නම් නූතන පටාචාරව ඇය වන්නට නොතිබුණිද ? දහස් ගනණක් වූ අන් අයත් ඒ අයුරින්ම මිය ගියේ ඔවුන්ද එකටම මිය යන්නට පතාගෙන ආ නිසාද ? සුනාමි අනතුරක් සිදුවන බව බලගතු රටවල් කල් ඇතුවම අපේ රටට දැන්වූයේ නම් සමූහයක් විසින් එක්ව වින්දා වූ මේ කර්මය වෙනස් කරගත හැකිව නොතිබුණේද ?

අහෝ ! එදා අප කොළඹ යන ගමනේදී ලතා අක්කලා දැක බලා ගෙන ගියේ නම් ? දැන්නම් ඉතින් මේ ආත්මේයේදී අපට එම සොයුරිය දැක ගන්නට නොලැබෙයි. මට ජීවිතය ගැන මහා කලකිරීමක් ඇතිවෙයි. පැරිසියේ ජීවත් වෙමින් අප මේ කරන්නේ සුඛෝපභෝගීව දිවි ගෙවමින් මුදල් ගොඩ

'මල්ලියේ' යන ගීතය විමුක්ති ගී ප්‍රසංග යේ ගැයුණ, හද කම්පා කරවන ගීතයකි. ප්‍රසංගයේදී එම ගීතය ගායනා කළේ 'තිලක් ඉද්දමල්ගොඩ' නැමැති සහෝදරයෙකි. 'නංගියේ, මල්ලියේ, දරුවනේ' යනුවෙන් දැන් එම ගීතය නැවත ඇසෙන්නේ ලයනල් බෝපගේ හා චිත්‍රා බෝපගේ ගේ වේදනාත්මක කටහඬවල්වලිනි. මුල් ගීතයේ පද මාලාව මඳ වශයෙන් වෙනස් කර ලයනල් බෝපගේ එම ගීතය ගයන්නේ සුනාමියෙන් බිලිගත් සිය ලොකු නංගී වෙනුවෙනි. ඇතැම්විට මුල් ගීතයේ පදමාලාව ද ලයියා විසින්ම පබැඳුවක් වෙන්නට ඇත. ගීතය නිබෙන්නේ අන්තර් ජාලයේ sinhala juke box.or.g. නම් වෙබ් අඩවියට ගිය විටදිය.

ප්‍රංශය ආදරය, විවාහය, මිත්‍රකම් වැනි සමාජ සම්බන්ධතාවල පැවැත්මට ලබාදෙන්නේ ඉතා කෙටි කාලසීමාවකි. එය ආදර්ශයට ගෙන ඇති නිසාදෝ ප්‍රංශයට පැමිණ සිටින අපේ ඇත්තෝද එකිනෙකා මා මිතුරකම් පවත්වන්නේ කෙටි කාලයකි. මාසයකින්

මල්ලී මා අමතන ලද්දේ කොළඹ සිටය. එදින අප්‍රේල් පළවෙනිදාවක් නොවූයෙන් මේ සීත ඍතුවේ පාන්දර පහට නින්ද කඩා විහිළු කිරීම ගැන ඇති වූ නොරිස්සුමෙන් මම මල්ලීට බැණ වැදුනෙමි. එය සත්‍යයක් බව මල්ලී දිවිරමින් පැවසී ය. ලංකාවට දුරකථන ඇමතුමක් ගත හැකි වූ මොහොතේ සිට මා දිගින් දිගටම උත්සහ කරන ලද්දේ මගේ ඥාති හිත මිතුරන්ගෙන් විපතට පත් වී ඇත්තේ කවුරුන්ද කියා දැන ගැනීමට ය.

'නංගියේ, මල්ලියේ, දරුවනේ' යනුවෙන් දැන් එම ගීතය නැවත ඇසෙන්නේ ලයනල් බෝපගේ හා චිත්‍රා බෝපගේ ගේ වේදනාත්මක කටහඬවල්වලිනි. මුල් ගීතයේ පද මාලාව මඳ වශයෙන් වෙනස් කර ලයනල් බෝපගේ එම ගීතය ගයන්නේ සුනාමියෙන් බිලිගත් සිය ලොකු නංගී වෙනුවෙනි. ඇතැම්විට මුල් ගීතයේ පදමාලාව ද ලයියා විසින්ම පබැඳුවක් වෙන්නට ඇත.

ගැසීම නොවනමුත් දිනෙන් දින ප්‍රචණ්ඩ වන ස්වභාවධර්මයේ ප්‍රහාර හමුවේ අප සියලු දෙනාම කොතරම් අසරණද ? 2003 වසරේදී පැරිසිය හරහා චන්ඩ සුළි සුළඟක් හමාගිය අතර උෂ්ණත්වය අධික වී 11,0000ක් මිය ගියා නොවේද ? දන්නා කාලයක නොආ සුනායක් කඩා වැදී දුප්පත් අපේ රටේ අසරණ වූ සේම, කවදාවත් නැති තරමට උෂ්ණත්වය අධික වූ විට සීතලට පමණක් විසඳුම් සොයාගෙන සිටි මේ ධනපති ප්‍රංශය ද අසරණ වූවා නොවිද ? අසාධාරණ ලෙස හා අධම ලෙස අන් රටවල ස්වාධීනත්වයට බලහත්කාරයෙන් අතපොවන, ලෝකයේ මහ බලවතා ලෙස පෙනිසිටි ඇමරිකා එක්සත් ජනපදය 'කැත්‍රිනා හා රිටා' නමින් හඳුන්වන ස්වභාවධර්මයේ බලගතු ප්‍රහාර දෙකකින් පහර කෑ කල දුප්පත් ලංකාවටත් වඩා කොතරම් අසරණවිද ?

සතුට මෙන්ම දුක ද පන්හිඳ ඔස්සේ ගලායාමට සලස්වා හිතේ බර සැහැල්ලු කර ගැනීමට හුරු පුරුදුව සිටින මා 'සුනාමියට හසු වූ ලතා අක්කා' යන මැයෙන් 'දිනපතා දිවයින'ට යැවූ ලිපිය 2005 පෙබරවාරි දා පළවිය.

දෙකකින් දුරකථන ඇමතුමක් නොදුන් විට පවා ප්‍රංශයේ (සිංහල) මිතුරෝ අමනාප වෙති. අප කිසිදා දුරකථනයෙන් නොඇමතන, ලිපියක් නොලියන ලංකාවේ පැරණි මිතුරෝ එසේ නොවෙති. ඒ අතින් ලංකාවේ සිටින අපේ පැරණි මිතුරන්ගේ මිත්‍රත්වය අඳටත් නා මලක් සේ පිවිතුරු, සුවඳත්, ලතා අක්කා වැනි මිතුරියන්ගේ වේදනාත්මක නික්මයාම අපට වාවාගත නොහැක්කේද එම නිසාම ය.

සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ නොවන්නාවූ විප්ලවවාදී දේශපාලන පක්ෂවලට විවිධ සමාජ පන්තීන්ට අයත් පුද්ගලයන් පැමිණෙන්නේ කුමණ අරමුණ හා හේතූන් නිසාදැයි එම සමාජ පන්තීන් වෙන් වෙන් වශයෙන් ගෙන ගැඹුරු විමර්ශනයක් කෙරි ඇති බවක් දැන ගන්නට නැත. සමාජවාදී විප්ලවයේදී ප්‍රමුඛතම බලවේගය වන්නේ කම්කරුවන්, ගොවියන්, ශ්‍රමිකයන්ගෙන් සැදී පීඩිත ජනතාව යයි පැවසෙතත් ලෝකයේ පැවති සියලු මාක්ස්වාදී, සමාජවාදී විප්ලවවලට හා අරගලවලට නායකත්වය දී ඇත්තේ මධ්‍යම පංතික බුද්ධිමතුන් හෝ සුළු ධනේශ්වර පංතිවලට අයත් උගතුන් හෝ බුද්ධිමතුන් වේ.

1971 කැරැල්ලේ මහ නඩුවේ චින්තිකරුවන් 41 දෙනා අතුරින් වැඩි පිරිසක් සැබෑ නායකයන් නොව එවකට පැවති සමගි පෙරමුණ රජයේ උවමනාව පරිදි නිර්මාණය කරගත් නායකයන් යැයි ජ.වි.පෙ. පවසන ලද මුත් එම නඩුවට නම් කෙරුණ පිරිස අතර ද, එයින් බැහැරව ද, පීඩිත පංතියට අයත් නොවන ඉහළ මධ්‍යම පන්තික පසුබිමක් ඇති පුද්ගලයෝ උන්හ. 1987-89 අරගලය තුළදී ද එම තත්වය එසේම විය. ඝාතනයට ලක්වූ මාධ්‍යවේදී රිවඩ් ද සොයිසා සොයුරාණන් ඉන් එක් අයකු සේ හැඳින්විය හැක.

මට මේ ටික සිහිපත් වූයේ මාලිංග සොයුරා සිහිපත් වූ කල්හිය. මව්සින් ලියන මේ අතිශයින්ම සීමිත ඉතිහාසය තුළ හෝ මාලිංග වැන්නවුන්ටත් තවත් කිහිප දෙනකුටත් ඉඩ ලැබිය යුතුය. නැතහොත් ඔවුහු ජ.වි.පෙ. වෙනුවෙන් එක් දහදිය බිඳක් හෝ හැලූ කොටස් කාරයින් නොවී ඉතිහාසය තුළම වැලලී යනු ඇත.

මාලිංග අගනුවර උසස් පාසලක අධ්‍යාපනය ලැබ ශ්‍රී ලංකාවට අතිශයින්ම වැදගත් වූ ආයතනයක විධායක මට්ටමේ රැකියාවක නිරතව සිටියේ යැයි පැවසීම ප්‍රමාණවත් යයි සිතමි. මාලිංගට ජ.වි.පෙ. දේශපාලනය රුචි වූයේ කෙසේදැයි යන්න ගැන අනුමාන නිගමනයක් මිස ස්ථිර නිගමනයක් මට නැත. එහෙත් මට සිතෙන්නේ ඒ සඳහා ඔහුට බොහෝ සේ බලපාන්නට ඇත්තේ මා බවය.

මාලිංගට වෙනත් සමීප මිත්‍රයින් සිටින්නට ඇත. එතේ මගේ විශ්වාසය පරිදි ගමේදී ඔහුට සිටි සමීපතම මිත්‍රයා මමය. ඔහුත් මෙත් එක්තරා කාලයක එක්ව ගතකළ කෙළිලොල් ජීවිතයෙන් මිදුන මම දිනෙන් දින ජ.වි.පෙ. දේශපාලනය තුලට ප්‍රවිෂ්ට වෙන අයුරු ඔහු මුලින් බලා සිටියේ මඳ විමතියකිනි. එහෙත් මා ද විමතියට පත් කරමින් ඔහුද මා ගත් මග ම ගත්තේ ය. එසේම පිරිපුන් ඉංග්‍රීසි දැනුමක් තිබූ ඔහු මට කියවන්නට නොලැබුණ මාක්ස්වාදී පොත පත කියවා විශාල දැනුමක් ද ලබා ගත්තේ ය. මට වඩා ඔහු ජ.වි.පෙ.ට සමීප කළේ ඒ දැනුමදෝයි මට සිතේ.

(ලබන කලාපයට)

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්
- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....
ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න
මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243